# අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා පැවති චීන-ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා

*කරුණාරත්න, යූ. ඩී. පී. ටී.* [1]

චීන-ශ්‍රී ලංකා සබඳතාවල ආරම්භය ක්‍රි. ව. 1වැනි සියවස තරම් ඈතට දිව යයි. පෙර-අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ කේන්ද්‍රස්ථානයක ලංකාව පිහිටා ඇති හෙයින් අතීතයේ සිට ලංකාව හා විදේශීය රටවල් සමඟ ගොඩනැගුණු සම්බන්ධතා වාණිජ අංශයට පමණක් සීමා නොවී දේශපාලන, සංස්කෘතික හා ආගමික අංශයන් ඔස්සේද විකාශය වී ඇත.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ චීන ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා වර්ධනය වූ ආකාරය පරීක්ෂා කිරීමය. මේ අනුව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරේ. හන් පෙළපතේ ඉතිහාසයට අනුව චීන-ලංකා සම්බන්ධතාව ගොඩනැගෙන්නේ **'මිං'** අධිරාජ්‍යයා විසින් (ක්‍රි. ව. 1-6) **'හුආංචි'** නම් ස්ථානයකට පිටත් කර හරින ලද **'හන්'** රාජ සභාවේ දූත මණ්ඩලයක් ආපසු එන ගමනේදී ලංකාවට පැමිණීමත් සමගය. මෙය හන් අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත කිරීමට ගත් උත්සාහයක් මිස දෙරට අතර ඇති වූ ආගමික සම්බන්ධතාවක් නොවේ. ආගමික සම්බන්ධතාවක් චීනය හා ලංකාව අතර ගොඩනැගෙන්නේ නැගෙනහිර චින් පෙළපත් සමයේදීය. ක්‍රි. ව. 141දී **'තාෂි'** නම් රටකින් චීනයට පැමිණි දූත පිරිසක් ගැන සඳහන් වේ. ඉතිහාසඥයන් මෙම රට ලංකාව ලෙස හඳුන්වා ඇති අතර මෙම දූත පිරිස මැණික් එබ්බවූ බුදු පිළිමයක්ද බෞද්ධ ලේඛන 10ක්ද චීනයට රැගෙන ගොස් ඇත. චීන මූර්ති ශිල්පියෙකු විසින් මෙහි ආකෘති 5ක් නිමවා ඇති අතර චිත්‍ර ශිල්පියකු විසින් එහි සිතුවමක්ද නිර්මාණය කරනු ලැබ ඇත.

චීන ශ්‍රී ලංකා සම්බන්ධතාවේ සුවිශේෂ කාල පරිච්ඡේදය ඇරඹෙන්නේ ෆාහියන් හිමිගේ සංචාරයත් සමගය. ෆාහියන් හිමිද අභයගිරියේ වැඩහිඳ බෞද්ධ ධර්මය අධ්‍යයනය කළ බව පැවසේ. මේ කාලයේදී චීන භික්ෂුණීන් වෙත දෙවන වරට උපසම්පදාව ලබාදී ඇත්තේද සිංහල භික්ෂුණීන් විසිනි. ඉන්පසු ක්‍රි. ව. 424, 428, 433 යන කාලවලදී දෙරට අතර ආගමික සබඳතා ඇති වූ නමුත් ක්‍රි. ව. 8වන සියවසේදී දෙරට අතර සම්බන්ධතා පිරිහෙන්නට විය. නැවත පොළොන්නරු

යුගයේදී මෙම චීන-ශ්‍රී ලංකා සම්බන්ධතා දක්නට ලැබුණු අතර, එය කෝට්ටේ යුගය දක්වා වර්ධනය විය. මේ අයුරින් ක්‍රි. ව. පළමුවැනි සියවසේ හන් රජ පෙළපත් යුගයෙන් ආරම්භ වූ චීන-ලංකා සම්බන්ධතා ඇතැම් යුගවලදී පරිහානියට පත් වුවද අනුරාධපුරයේ සිට කෝට්ටේ යුගය දක්වා වූ දීර්ඝ ඉතිහාසයක් එම සබඳතා හා බද්ධව පවතින බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** : චීනය, ශ්‍රී ලංකාව, අනුරාධපුරය, කෝට්ටේ, ආගම

[1]*ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.* sumuduprarthana92@gmail.com